# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 2019 අංක 14 දරන පඩිපාලක සභා (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2019 සැප්තැම්බර් මස 24 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2019 සැප්තැම්බර් මස 27 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකි ය.

**මිල :** රු. 12.00 **තැපැල් ගාස්තුව :** රු. 15.00

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## 2019 අංක 14 දරන
## පඩිපාලක සභා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2019 සැප්තැම්බර් මස 24 වන දින]

එල්.ඩී.—ඕ. 55/2009

**පඩිපාලක සභා ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 2019 අංක 14 දරන පඩිපාලක සභා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** (මෙහි මින්මතු ''ප්‍රධාන ප්‍රඥප්තිය'' යනුවෙන් හඳුන්වනු ලබන) (136 වන අධිකාරය වූ) පඩිපාලක සභා ආඥාපනතේ 4 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— 136 වන පරිච්ඡේදයේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:—

"(1) මේ කොටසේ මෙම වගන්තියේ විධිවිධානවලට එකඟව ක්‍රියා කිරීම පැහැර හරිනු ලබන යම් සේවා යෝජකයකු වරදකට වරදකරු වන අතර, එසේ වරදකරු කරනු ලැබීමේ දී ඒ තැනැත්තා රුපියල් පන්දහසකට නොඅඩු සහ රුපියල් දසදහසක් නොඉක්මවන දඩ මුදලකට හෝ එක් අවුරුද්දක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකට ම යටත් විය යුතු ය.'';

(2) එම වගන්තියේ (2අ) උපවගන්තියේ—

(අ) එම වගන්තියේ (ඇ) ඡේදයේ ''අධිභාරයක්'' යන වචනය වෙනුවට ''අධිභාරයක්;'' යන වචනය ආදේශ කිරීමෙන්; සහ

(ආ) එම වගන්තියේ (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන්:—

''(ඈ) ඒ මුදල මාස විසිහතරක් ඉක්මවන කාලයක් සඳහා හිඟව ඇති අවස්ථාවක, ඉන්පසු සෑම එක් එක් මාස දෙළහක

කාලයක් සඳහා ම ඒ මුදලෙන් සියයට දහයක අධිභාරයක්.''.

ප්‍රධාන ප්‍රඥප්තියේ 41 වන වගන්තිය සංශෝධනය කිරීම.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 41 වන වගන්තියේ (2) වන උපවගන්තියේ ''දින සිට ආරම්භවන වසර හතරක්'' යන වචන වෙනුවට ''දින සිට ආරම්භ වන වසර හයක්'' යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 44 වන වගන්තිය සංශෝධනය කිරීම.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 44 වන වගන්තියේ (1) වන සහ (2) වන උපවගන්ති ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

''(1) 21 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව යම් සේවකයකුට පඩි ගෙවීම පැහැර හරින ලද සෑම සේවායෝජකයකු ම වරදකට වරදකරු වන අතර, එසේ වරදකරු කිරීමේ දී රුපියල් පන්දහසකට අඩු නොවන සහ රුපියල් දසදහසක් නොඉක්මවන දඩ මුදලකට හෝ එක් අවුරුද්දක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකට ම සහ ඊට අමතරව එසේ වරදකරු කිරීමෙන් පසුව එම වරද දිගට ම කරගෙන යෑමේ දී එම සෑම එක් එක් දිනයක් සඳහා ම රුපියල් පන්සියයක් නොඉක්මවන දඩ මුදලකට ඔහු යටත් විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් යම් සේවායෝජකයකු නොවන මේ ආඥාපනතේ මේ කොටසේ විධිවිධාන ප්‍රකාරව හෝ පඩිපාලක සභාවේ යම් තීරණයක් ප්‍රකාරව යම් සේවකයකුට ගෙවීම් කිරීම පැහැර හරිනු ලබන යම් සේවායෝජකයකු වරදකට වරදකරු වන අතර, එසේ වරදකරු කිරීමේ දී රුපියල් පන්දහසකට අඩු නොවන සහ රුපියල් දසදහසක් නොඉක්මවන දඩ මුදලකට හෝ එක් අවුරුද්දක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකට ම සහ ඊට අමතරව එසේ වරදකරු කිරීමෙන් පසුව එම වරද දිගට ම කරගෙන යෑමේ දී එම සෑම එක් එක් දිනයක් සඳහා ම රුපියල් පන්සියයක් නොඉක්මවන දඩ මුදලකට ඔහු යටත් විය යුතු ය.''.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තියේ (1) වන උපවගන්තියේ ''අවුරුදු හතරක කාලසීමාව ඇතුළත'' යන වචන වෙනුවට ''අවුරුදු හයක කාලසීමාව'' යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තිය සංශෝධනය කිරීම.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 48 වන වගන්තියේ (1) වන උපවගන්තියේ ''රුපියල් පන්සියයක් නොඉක්මවන දඩ මුදලකට'' යන වචන වෙනුවට ''රුපියල් පන්දහසක් නොඉක්මවන දඩ මුදලකට'' යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 48 වන වගන්තිය සංශෝධනය කිරීම.

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 50 වන වගන්තියේ (1) වන උපවගන්තියේ ''රුපියල් දෙසීයක් නොඉක්මවන '' යන වචන සහ ''මාස තුනක් නොඉක්මවන'' යන වචන වෙනුවට පිළිවෙලින් ''රුපියල් පන්දහසකට අඩු නොවන'' යන වචන සහ ''මාස දෙළහක් නොඉක්මවන'' යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 50 වන වගන්තිය සංශෝධනය කිරීම.

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වන වගන්තියේ ''රුපියල් දෙසීයක් නොඉක්මවන'' යන වචන සහ ''මාස තුනක් නොඉක්මවන'' යන වචන වෙනුවට පිළිවෙලින් ''රුපියල් පන්දහසකට අඩු නොවන'' යන වචන සහ ''මාස දෙළහක් නොඉක්මවන'' යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වන වගන්තිය සංශෝධනය කිරීම.

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 56 වන වගන්තියේ (ඇ) ඡේදයේ ''අවුරුදු හතරක් ඇතුළත'' යන වචන වෙනුවට ''අවුරුදු හයක් ඇතුළත'' යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 56 වන වගන්තිය සංශෝධනය කිරීම.

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 58 වන වගන්තියේ (උ) ඡේදයට ඉක්බිතිව ම වූ ඡේදයේ ''රුපියල් එක් දහසක් නොඉක්මවන'' යන වචන සහ ''මාස හයක් නොඉක්මවන'' යන වචන වෙනුවට පිළිවෙලින් ''රුපියල් විසිදහසකට අඩු නොවන'' යන වචන සහ ''මාස දෙළහක් නොඉක්මවන'' යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 58 වන වගන්තිය සංශෝධනය කිරීම.

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 59අ වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 59අ වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

''යම් වෙළෙඳ හෝ වාණිජ අරමුණු ආකාරයෙන් කරනු ලබන වැඩපිළිවෙලක් යටතේ වැඩ කිරීම සඳහා තැනැත්තන් සේවයේ නියුක්ත කරවනු ලබන අවස්ථාවක දී අදාළවන විශේෂ විධිවිධාන.

59අ. (1) යම් තැනැත්තකු විසින් එම තැනැත්තාගේ ව්‍යාපාරික කටයුතුවල යම් මූලික කොටසක් සඳහා වෙනත් තැනැත්තකු සමග යම් වෙළෙඳ හෝ වාණිජ කාර්යය සඳහා ප්‍රකාශිත හෝ ව්‍යංගික කොන්ත්‍රාත්තුවකට හෝ වැඩ පිළිවෙළකට ඇතුළත්වන අවස්ථාවක දී සහ එම කොන්ත්‍රාත්තුව හෝ වැඩ පිළිවෙලට අනුව එම තැනැත්තා විසින් සේවා නියුක්තිකයන් යොදවනු ලබන අවස්ථාවක දී, එම සේවා නියුක්ත කොන්ත්‍රාත්තුව හෝ වැඩපිළිවෙළ වසන් වූ සේවා නියුක්ත සම්බන්ධතාවක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) නිසි පරීක්ෂණයකින් පසුව, එම කොන්ත්‍රාත්තුව හෝ සේවා වැඩපිළිවෙළ ඇත්ත වශයෙන්ම වසන් වූ සේවා නියුක්ත සම්බන්ධතාවක් බවට කොමසාරිස්වරයාගේ මතය වන අවස්ථාවක දී, ඔහු විසින් (1) වන උපවගන්තියේ සඳහන් පළමුව සඳහන් කළ තැනැත්තා වෙත එකී සේවා නියුක්තිකයන් සම්බන්ධයෙන් වූ එම කොන්ත්‍රාත්තුව හෝ වැඩපිළිවෙළ යටතේ වැඩ ක්‍රියාත්මක කරවා ගැනීමෙන් වළකින ලෙස ලිඛිතව විධාන කරනු ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ තමා සම්බන්ධයෙන් කරන ලද යම් විධානයක් මගින් අතෘප්තියට පත්වන යම් තැනැත්තකුට එම විධානය කිරීමේ දින සිට දින තිහක් ඇතුළත මෙම පනතේ 59ආ වගන්තිය යටතේ පිහිටුවන ලද සේවා නියුක්ත සම්බන්ධතා පිළිබඳ විශේෂ විනිශ්චය සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමේ අයිතියක් ඇත්තේ ය. සේවා නියුක්ත සම්බන්ධතා පිළිබඳ විශේෂ විනිශ්චය සභාව විසින් ඉන්පසු අදාළ සියලු පාර්ශ්වයන් කැඳවනු ලැබ කොමසාරිස්වරයාගේ විධානය තහවුරු කිරීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ තීරණයක් නිකුත් කරනු ලැබිය යුතු ය.''.

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 59අ වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එම වගන්ති 59ආ, 59ඇ, 59ඈ වගන්ති ලෙස බලාත්මක විය යුතු ය:—

ප්‍රධාන ප්‍රඥප්තියට 59ආ, 59ඇ, 59ඈ වගන්ති ඇතුළත් කිරීම.

''සේවා නියුක්ත සම්බන්ධතා පිළිබඳ විශේෂ විනිශ්චය සභාවක් පිහිටුවීම.

59ආ. (1) 59අ වගන්තියේ (3) වන උපවගන්තිය ප්‍රකාරව යම් අතෘප්තියට පත් තැනැත්තකු විසින් ඉදිරිපත් කරනු ලබන අභියාචන විභාග කිරීම සඳහා (මෙහි මින්මතු ''විනිශ්චය සභාව'' යනුවෙන් හඳුන්වනු ලබන) සේවා නියුක්ත සම්බන්ධතා පිළිබඳ විශේෂ විනිශ්චය සභාවක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) විනිශ්චය සභාව අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන සාමාජිකයන් තිදෙනකුගෙන් සමන්විත විය යුතු ය. එම සාමාජිකයන් තිදෙනා කම්කරු නීතිය පිළිබඳ පුළුල් දැනුමක් සහ පළපුරුද්දක් ඇති තිදෙනකු විය යුතු අතර, ඔවුන් අතරින් විනිශ්චය සභාවේ සභාපති විය යුතු තැනැත්තා ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ අභියාචනාධිකරණයේ විශ්‍රාමික විනිසුරුවරයකු විය යුතු ය.

(3) විනිශ්චය සභාවේ සාමාජිකයකු වසර තුනක කාලයක් සඳහා ධුරය දැරිය යුතු අතර නැවත පත්කිරීම සඳහා සුදුසු විය යුතු ය.

(4) යම් සාමාජිකයකු විසින් තත්කාර්යය සඳහා අමාත්‍යවරයා අමතන ලද ලිපියක් මඟින් ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර එම ඉල්ලා අස්වීම අමාත්‍යවරයා විසින් පිළිගනු ලැබීමේ දී එම ඉල්ලා අස්වීම බලාත්මක වන්නේ ය.

(5) ඉල්ලා අස්වීම, සේවයෙන් පහකිරීම, මියයෑම හෝ රෝගාතුරවීම නිසා ස්වකීය ධුරයේ කටයුතු කිරීමට නොහැකිවීම හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරවීම හෝ වෙනත් යම් හේතුවක් නිසා යම් තැනැත්තකු විසින් ස්වකීය ධුරය හිස්කරනු ලබන අවස්ථාවක දී අමාත්‍යවරයා විසින් (2) වන උපවගන්තිය ප්‍රකාරව ඒ වෙනුවට වෙනත් තැනැත්තකු නම් කරනු ලැබිය හැකි අතර එම තැනැත්තා තමා අනුප්‍රාප්තවන සාමාජිකයාගේ ඉතිරි ධුර කාලය සඳහා ධුරය දැරිය යුතු ය.

(6) තත්කාර්යය සඳහා හේතු දක්වා අමාත්‍යවරයා විසින් විනිශ්චය සභාවේ යම් සාමාජිකයකු ඉවත් කරනු ලැබිය හැකි ය.

(7) විනිශ්චය සභාවේ වාර්තා පවත්වාගෙන යා යුතු සහ විනිශ්චය සභාවේ කාර්ය සම්බන්ධයෙන් විනිශ්චය සභාව සහ කොමසාරිස්වරයා විසින් පවරනු ලබන වෙනත් යම් කාර්ය සිදුකරනු ලැබිය යුතු කොමසාරිස්වරයා විසින් පත්කරනු ලබන විනිශ්චය සභා ලේකම්වරයකු සිටිය යුත්තේ ය.

(8) විනිශ්චය සභාවේ කාර්ය පහසු කිරීම සඳහා අවශ්‍යවන නිලධරයන් සහ සේවකයන් කොමසාරිස්වරයා විසින් පත්කරනු ලැබිය හැකි ය.

(9) මුදල් විෂයභාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි පාරිශ්‍රමික විනිශ්චය සභාවේ සාමාජිකයන් වෙත ගෙවනු ලැබිය හැකි ය.

විනිශ්චය සභාවේ බලතල හා කර්තව්‍ය.

59ඇ. (1) ස්වභාවික යුක්ති මූලධර්ම ප්‍රකාරව 59අ වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ විනිශ්චය සභාව වෙත ඉදිරිපත් කරනු ලබන අභියාචන පිළිබඳ විනිශ්චය සභාව විසින් විභාගකර නිශ්චය කරනු ලැබිය යුතු ය. තීරණයක් කරනු ලැබීමේ දී, සභාපතිවරයා විසින් වහාම එම තීරණය කොමසාරිස්වරයා සහ පාර්ශ්වයන් වෙත දැනුම්දිය යුතු ය.

(2) විනිශ්චය සභාවේ තීරණයක් ලැබීමෙන් පසුව, කොමසාරිස්වරයා විසින් එම තීරණය *ගැසට් පත්‍රයේ* පළකිරීමට කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

(3) එම තීරණය *ගැසට් පත්‍රයේ* පළකරනු ලබන දින සිට හෝ එහි සඳහන් යම් දිනයක සිට පාර්ශ්වයන් අතර බලාත්මක විය යුතු ය.

නඩු පැවරීම සඳහා කොමසාරිස්වරයාට ඇති බලය.

59ඈ. 59අ වගන්තිය යටතේ කොමසාරිස්වරයා විසින් කරනු ලබන යම් විධානයකට එකඟව ක්‍රියා කිරීම පැහැර හරිනු ලබන හෝ 59ඇ වගන්තිය යටතේ විනිශ්චය සභාවේ යම් තීරණයක් උල්ලංඝනය කරමින් ක්‍රියා කරනු ලබන යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර, කොමසාරිස්වරයා හෝ ඔහු විසින් යථා පරිදි ලිඛිතව බලය දෙන ලද යම් තැනැත්තකු විසින් එකී තැනැත්තාට එරෙහිව උචිත මහෙස්ත්‍රාත් අධිකරණයක නඩු පවරනු ලැබිය හැකි ය.''.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

13. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි “ප්‍රකාශන පියස” හි දී මිල දී ගත හැකි ය.